සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

**8 - ශ්‍රේණිය** 28996

සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය:-** .................................................................................. **කාලය: පැය 2යි.**

## I කොටස

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ප්‍රවිශ්ට / ප්‍රවිෂ්ට / ප්‍රවිශ්ය

(2) ගෞරවනීය / ගෞරවණීය / ගෞරවනීය

- හිස්තැනට සුදුසු පද යොදා පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(3) ගහට ................................ කැපුවා වගෙයි.

(4) කොට්ටෝරුවා ..............................කෙටුවා වගෙයි.

- සුදුසු යුගල පද ලියන්න.

(5) ඔවුහු ගම් ..................................අතහැර ගියහ.

(6) රටවැසියෝ සාමයෙන්.............................. කල් ගෙවති.

- විරාම ලකුණු නිවැරදි ලෙස යොදන්න.

(7) ගුරු මැණිවරුනි සහෝදර සහෝදරයනි අපේ කණ්ඩායම ඉදිරිපත් කරන්නේ ලී කෙළිය නම් වූ ජන ක්‍රීඩාවයි

- පහත සඳහන් වගන්තිවල ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(8) රජතුමා රටවැසියන් ලවා වැව් බඳවයි. (මිශ්‍ර ක්‍රියා / ප්‍රයෝජ්‍ය ක්‍රියා / පූර්ව ක්‍රියා)

(9) අමරා කෙක්කෙන් අඹ කඩා මල්ලට දැමුවා ය. (ප්‍රයෝජ්‍ය ක්‍රියා / මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා)

(10) තද්ධිත පදයක් වරහන් තුළින් තෝරා ලියන්න.
(කපන්නා / ආලෝකවත් / පිණිස)

(11) කෘදන්ත පදයක් වරහන් තුළින් තෝරා ලියන්න.
( ගෙදර / රුහුම් / බලව්)

- සුදුසු පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(12) සයුරු රළ පෙළ වෙරළ සිප ..............................(ගනිති. / ගනියි. / ගත්හ.)

(13) විලේ .................................... පිපෙති. (පියුම් / පියුම / පියුම්හු)

(14) නැන්දා මට ගවුමක් ..............................(මැසුවාය. / මැසුවේය. / මසන්නෝය.)

(15) .............................. පියාට උපස්ථාන කරති. (පුතණුවෝ / පුතා / පුතණුවන්)

(16) ඔවුහු උදෑසනින් ම ගමට ..............................( ගියාය. / යයි. / යති.)

(17) .............................. සැම සමගියෙන් වැඩ කරමු. (අප / අපි / අප විසින්)

(18) දෙමවුපියන් විසින් දරුවෝ ..............................(රකිති. / රැකේ. / රැකෙති.)

(19) තොපි පොත් පාඩම් ..............................( කළෙහු ද ? / කළෙහි ද? /කළේ ද?)

- නිවැරදි ව පද බෙදා ලියන්න.

(20) පහත් බිම් වල රබර්වගාව සරුලෙස කළහැකිය. (ලකුණු 2 X 20 =40)

## II කොටස

1 සහ 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

(1) සිංහල විෂයයට අදාළ ව ඔබ පන්ති කාමරයේ දී සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබ සැකසූ බිත්ති පුවත්පතේ නම ලියන්න. (ල 3)

(ii) ඒ සඳහා නිර්මාණ සැකසීමේ දී ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද? (ල 3)

(iii) අනෙක් කණ්ඩායම්වලට ලැබුණු මාතෘකා තුනක් නම් කරන්න. (ල 3)

(iv) බිත්ති පුවත්පතක තිබිය යුතු විශේෂ ලක්ෂණයක් ලියන්න. (ල 3)

(v) බිත්ති පුවත්පත පිළිබඳ ඔබේ අදහස් වගන්ති දෙකකින් ලියන්න. (ල 4)

(ල 16)

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

(i) ගැමි දිවිය ඔප කරන සාරධර්ම අගයමු

(ii) අසිරිමත් මහ සයුර

(iii) ගංවතුරේ ඔරු පැද්දෙමු

(iv) ලොව විස්මිත නිර්මාණ

(v) රූපවාහිනියෙන් නිසි ඵල ලබමු (ල 14)

(3) ඔබ විසින් මෑතකදී මිල දී ගන්නා ලද සිංගර් මහන මැෂිමේ පවතින යාන්ත්‍රික දෝෂය පිළිබඳ ව දන්වා එය නිසි ලෙස සකස් කර දෙන මෙන් ඉල්ලමින් රත්මලානේ සිංගර් සමාගමේ කළමනාකරු වෙත යවන ලිපිය සකස් කරන්න. (ල10)

(4) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| පාඨය | පාඩමේ නම | කීවේ කවුරුන් විසින් ද? |
|---|---|---|
| (i)" මා අයාමෙක අවුත් රාජ්‍යය හැර ගනුව" | | |
| (ii) " ගෙනෙව කුඩාවරුනි, මම පොහොසත්මි" | | |
| (iii) "මට අවුරුදු පනස් අටක් වයසයි" | | |
| (iv) "අනේ පිං සිද්ධ වෙයි. කට වහගෙන ඉන්නකෝ" | | |
| (v) "සමන් දෙවියන්ට බුදු බව ලැබෙන්ඩ ඕනෑ" | | |

(ල 1 X 10 =10)

(5) ..........................................................

ගෙඩි සතරකි පල ගත්තේ

පුතු වෙනුවෙනි පැණි පිරුණේ

..........................................................

(i) හිස්තැන්වලට අදාළ පද්‍ය පාද ලියා ඉහත පද්‍යය සම්පූර්ණ කරන්න.

(ii) එහි අර්ථය පැහැදිලි කරන්න. (ල 5 X2 =10)

(6) පහත සඳහන් පද්‍යය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

දියනෙත් දහම රන් පාටින් හෙළි වේය
බිය නැති බවට සිහරද සලකුණු වේය
නියමය බලය රන් කඩුවෙන් කියැ වේය
මෙය අප සිංහ කොඩියේ තොරතුරු වේය

(i) මෙම පද්‍යයෙන් කියැවෙන්නේ කුමක් ගැන ද?

(ii) එය කුමන රටකට අයත් ද?

(iii) එහි දැක්වෙන සලකුණු දෙකක් දක්වන්න.

(iv) දියනෙත් දහම, සිහරද යන වචනවල අර්ථ දක්වන්න.

(v) මේ කවිය කියවන විට ඔබ තුළ ඇති වන හැඟීම් වගන්ති දෙකකින් පමණ ලියන්න.

(ල 2 × 5 = 10)

(7) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අද පවතින ජන සමාජයන්හි භාෂාව පිළිබඳ ව දක්වන නොසැලකිලිමත්කම ද හෙළ බසෙහි පිරිහීමට හේතු වී ඇත. ඔවුන් බස පිළිබඳ ව දක්වන සැලකිල්ල ගැන අපට කිසිසේත් ම සතුටු විය හැකි නොවේ. එහි යෙදුම්වල අක්ෂර වින්‍යාසය වැරදි ය. වචන භාවිතය ගැන නොතකයි. අවියත් යෙදුම්වලින් ගහන ය. ව්‍යාකරණ දෝෂ බහුල ය. ඉංග්‍රීසි බස කලවම් කොට යොදයි. ඉදිරිපත් කරන අදහස් පවා ව්‍යාකූලයි. ජනමාධ්‍ය එසේ සාවද්‍ය ලෙස භාෂාව භාවිත කරන විට ජනතාව එය නිවැරදි යැ යි පිළිගනී. මේ තත්ත්වය වහාම නිවැරදි නොවුණහොත් හෙළ ජන සමාජය සංකර සමාජයක් වනු නොඅනුමාන ය.

(i) මෙහි සඳහන් පරිදි හෙළ බසෙහි පිරිහීමට හේතු වී ඇත්තේ කුමක් ද?

(ii) හෙළ බස පිරිහී ඇති බවට දැක්විය හැකි සාධක තුනක් ලියා දක්වන්න.

(iii) වැරදි ලෙස හෙළ බස භාවිත කිරීමෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵලය කුමක් ද?

(iv) පහත සඳහන් වචනවල අර්ථ දක්වන්න.

- සාවද්‍ය
- අවියත්

(v) ඉහත ඡේදයට ගැළපෙන මාතෘකාවක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)